මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம்,கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2021 – 08 - 06

ප්‍රවෘත්ති නිවේදනය - 09

## දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට ප්‍රමුඛතාව දෙනවා...
## - මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා

භාණ්ඩ ආනයනය අවම කර දේශීය නිෂ්පාදනය ඉහළ නංවමින් විදේශ විනිමය මෙරට තුළ ඉතිරි කර ගැනීමට අපේක්ෂා කරන බව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා පවසයි.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් දේශීය වශයෙන් නිෂ්පාදනය කළ ඖෂධ වර්ග දෙකක් වෙළෙඳ පොළට නිකුත් කිරීමේ අවස්ථාවට අද (06) රත්මලාන ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ දී එක් වෙමින් අමාත්‍යවරයා මේ බව පැවැසීය.

වේදනා නාශකයක් වන ට්‍රැමඩෝල් (Tramadol) සහ තයිරොක්සීන් ඌණතාව වෙනුවෙන් භාවිත කෙරෙන ලෙවොතයිරොක්සීන් (Levothyroxine) යන ඖෂධ වෙළෙඳ පොළට නිකුත් කිරීම මෙහි දී සිදු විය. ට්‍රැමඩෝල් මිලිග්‍රෑම් 50 කරල් මිලියන 9.8ක් වාර්ෂිකව ශ්‍රී ලංකාවේ භාවිත වන අතර ලෙවොතයිරොක්සීන් මිලිග්‍රෑම් 50 පෙති මිලියන 98ක් පමණ වාර්ෂිකව භාවිත කෙරේ. මෙම ඖෂධ ආනයනය නතර කිරීම මගින් වාර්ෂික ඉතිරි වන මුදල රුපියල් මිලියන 88කි.

ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති මාලාවට අනුව දේශීය නිෂ්පාදනය ප්‍රමුඛ කරගත් ආර්ථිකයක් ගොඩනැංවීමට රජය මේ වන විට කටයුතු කරමින් ඇති අතර එහි මූලික පියවරක් ලෙස තෝරා ගත් ආහාර ද්‍රව්‍ය 16ක ආනයනය සීමා කිරීමට කටයුතු කළ බව පෙන්වා දුන් රාජපක්ෂ මහතා එතුළින් මේ වන විට සාර්ථක ප්‍රතිපල ළගා කර ගැනීමට හැකි වී ඇති බව ද කියා සිටියේ ය. දේශීය ගොවියා කෙරෙහි විශ්වාසය තබමින් දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු කළා සේ ම ඖෂධ නිෂ්පාදනය ඇතුළු අනෙකුත් නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි උන්නතිය වෙනුවෙන් රජය ක්‍රමවත් වැඩපිළිවෙළක් දියත් කරමින් සිටින බව ද බැසිල් රාජපක්ෂ මහතා මෙහි දී පැවැසීය.

මෙහි දී වැඩි දුරටත් අදහස් දැක් වූ රාජපක්ෂ මහතා සඳහන් කළේ පසුගිය රජය විසින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වෙත ගෙවීමට විශාල ණය ප්‍රමාණයක් ඉතිරි කර තිබූ අතර එම ණය ගෙවා දැමීමට තමාට පෙර මුදල් අමාත්‍ය ධුරය දැරූ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා කටයුතු කළ බවයි. ඒ අතර ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ගෙවීමට තිබූ රුපියල් මිලියන 1945ක මුදල ද පියවීමට කටයුතු කළ බව මුදල් අමාත්‍යවරයා මෙහි දී පැවැසීය.

ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ඖෂධවලින් 20%ක් පමණක් මේ වන විට දේශීය වශයෙන් නිපදවන අතර එය 50% දක්වා ඉහළ නැංවීම රජයේ අපේක්ෂාව බව ද මුදල් අමාත්‍යවරයා මෙහි දී වැඩි දුරටත් පැවැසීය.

ඖෂධ නිෂ්පාදන සිදු කෙරෙන ආකාරය පිළිබඳ නිරීක්ෂණ චාරිකාවකට ද මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා මෙහි දී එක් වූ අතර මහාචාර්ය චන්න ජයසුමන සහ ආචාර්ය නාලක ගොඩහේවා යන රාජ්‍ය අමාත්‍යවරු ද මෙම අවස්ථාවට එක් වූහ.

**මාධ්‍ය ඒකකය,**
**මුදල් අමාත්‍යාංශය**